# සැදෑවී

சந்தாவ

මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
2019 ජනවාරි -මාර්තු කලාපය


## සැදෑවේ අරුත

**(සංස්කාරක පෙරවදන)**

අපි ජ්‍යේෂඨයෝද?... නැතිනම් විශ්‍රාමිකයෝද...?

**ජ්‍යේෂ්ඨයෝ** කියන්නේ **විශ්‍රාමිකයාට** කියන වෙනත් නමක්ද...? එහෙම නැතිනම් ''දැන් අපි හැට පැනපු අය'' කියන පසුගාමී සිතිවිල්ලෙන් මිදෙන්න ඉදිරියට දමාගත් ටයිටලයක්ද...?

නැහැ... කොහෙත්ම නැහැ සැබවින්ම අප ජ්‍යේෂඨයන් බවට පත්කොට ඇත්තේ. අපේ මුළු ජීවිත කාලය පුරා අත්විඳි අනේක හැලහැප්පීම්, ජය පැරදුම්, සැප දුක් හරහා අප ලද **ජීවන පන්නරය** විසින්මයි.

ජ්‍යේෂ්ඨත්වයේ ඵල ලබන්නට නම් අප ලද ඒ පන්නරය අපි හඳුනාගත යුතුයි. භාවිතයට ගත යුතුයි.

විශ්‍රාම ගියදා අපට නැතිව ගියේ රැකියාව පමණයි.

හැබැයි අපේ 'හැකියාව' තාම අපි ලඟ.

රැකියාව අප වෙතින් ඉවත්ව ගියේ අපේ ජීවිතයේ 'රැකියාවට' තිබූ පරාසයත් අපේ හැකියාවට එකතුකර දී බව අප තේරුම් ගන්න ඕන.

කාලය විසින් අපගේ ශරීරය, ශක්තිය, රූපය කෙමෙන් කෙමෙන් දුර්වල කරන බව ඇත්ත.

නමුත් විශ්‍රාම ගිය පසු අපගේ ක්‍රියාකාරකම්වලට බලපාන්නේ වෙනස්වන ශරීර ශක්තියට වඩා අප විසින්ම ඊට වඩා වේගයෙන් වෙනස්කොට ගත් මානසික තත්ත්වය නොවේද?

**හිතන්න පොඩ්ඩක් ...**

ඒ සඳහා ඔබට උත්තේජනයක් ලෙස මෙන්න ලෝ පතුල නවකතාකරු 'අර්නස්ට් හෙමිංවේ' ගේ ''මහල්ලා සහ මුහුද'' නවකතාවේ කොටසක්, මසුන් මරන්නෙකු වූ එකී මහල්ලාගේ වචනවලින්ම

> **''මහළුකමට මිනිසෙකු කොයි**
> **මොහොතේ හෝ විනාශ කළ හැකියි.**
> **නමුත් පරාජය කරන්න බැහැ...**
> **මගේ ජීවන රැකියාව මට උරුම කළ**
> **මේ හබල මගේ අතේ තිබෙන තුරු**
> **මහ මුහුද මට සුළු දෙයක්.''**



# කෘතගුණ පූර්වක
## පුණ්‍යකර්මයක්



හිටපු මහ බැංකු අධිපතිවරයෙකු වූ **ආචාර්ය එච්.එන්.එස්. කරුණාතිලක ශ්‍රීමතාණන්** දිවංගත වී වසර 9ක් පිරීම නිමිත්තෙන් එතුමාගේ ගුණ සිහිකිරීමේ සහ එතුමාට පිං පැනවීමේ පුණ්‍යකර්මයක් ආචාර්ය **එච්.එන්.එස්. කරුණාතිලක අනුස්මරණ කමිටුව** මඟින් පසුගිය පෙබ. 28 වෙනි දින රාජගිරිය මහ බැංකු පරිශ්‍රයේදී සිදුකෙරුණි. මෙම ධර්ම දේශනාව පවත්වන ලද්දේ **බම්බලපිටිය සිරි වජිරාමවාසී මීගොඩ සුබිත ස්වාමින් වහන්සේ** විසිනි.

මෙම පුණ්‍යකර්මයට සමගාමීව කරුණාතිලක මැතිතුමන්, එම මැතිණිය, මියගිය සියලු අධිපතිවරුන්, මහ බැංකු බෝම්බ ප්‍රහාරයෙන් මියගිය සියලු දෙනාද ඇතුළත්ව මහ බැංකුවේ සේවය කොට මියගිය අනෙකුත් සැමට පිං පිණිස පහත සඳහන් ධර්මායතන වෙත මූල්‍යමය වශයෙන් පුණ්‍යාධාරයන් සිදු කිරීමට ද කමිටුව කටයුතු යොදා තිබුණි.

- සම්බෝධි විහාරය
- සිරි වජිරාරාම දහම් පාසල
- හොරණ සීලසුව ආරණ්‍ය භික්ෂු ආරෝග්‍ය ශාලාව

මේ සද්කර්මය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමයද එහි සාමාජිකයින් පිරිසකගේ පෞද්ගලික දායකත්වය ලබාදීමට කටයුතු සලස්වා දෙන ලදී.

මෙම ගුණානුස්මරණ කමිටුව මගින් එදින පැමිණ සිටි පිරිස අතට පත්කළ පත්‍රිකාවක ආචාර්ය නෙවිල් කරුණාතිලක ශ්‍රීමතාණන්ගේ කාර්ය සාඵල්‍යය සහ එතුමා බැංකු සේවකයන් වෙනුවෙන් ඉටුකළ විශිෂ්ඨ කාර්යභාරය පිළිබඳව තබා තිබූ සටහනක් පහතින් දක්වමු.

**Tribute To Late**
**Dr. H.N.S. KARUNATILAKE**
**(1930 – 2010)**
**On His 9th Death Anniversary**
Governor. Central Bank of Sri Lanka
(1988 – 1992)

It is with utmost respect and gratitude that we commemorate the 9th death anniversary of Dr H.N.S. Karunatilake.

His exemplary managerial and leadership qualities enabled him to make an indelible contribution towards the upliftment of the quality and efficiency of the Central Bank. He was magnanimous in providing improved working conditions to the satisfaction of the staff, while ensuring that they follow the rules and regulations to the letter.

Late Governor Karunatilake provided the leadership and guidance to strengthen the banking and financial system of the country and was instrumental in the introduction of necessary legislation for this purpose.

We are grateful to him, in particular, for the following distinct steps taken for the benefit of the staff and the economy in general;

- Introducing a protective barrier and employing additional security staff to avoid a possible risk of a terrorist attack on the Central Bank.
- Establishing holiday homes and enhancing welfare benefits to the staff.
- Providing greater training opportunities and scholarship facilities to the staff.
- Introducing a salary structure compatible with that of commercial bank for the staff.
- Strengthening the RRDB system to effectively meet the financial needs of the poverty ridden people and micro and small entrepreneurs.

# සදා... අමතක නොවන දිනය...

වසරකට වරක් ශ්‍රී ලංකා මහ බැංකුව චාම්, ඒ සැමට වඩා අතිශය සංවේදී අභිමානවත් සුවිශේෂී සැමරුම් දිනයක් පවත්වයි. ඒ ජනවාරි 31 දායි. මෙම සැමරුම අප සැමගේම හදවත් තුලින් උපදින මිනිසත්කමට හිමි සෙනෙහසේ දයාවේ ආදරණීය සැමරුමකි.

එදාත්... එනම් **1996 ජනවාරි 31** දාත් මහ බැංකුවේ අප සැම සේවයට පැමිණියේ සැමදා සුපුරුදු ආශාවෙන්, උද්යෝගයෙන් සහ සතුටින් පිරුන සිත් සමගිනි. උදෑසන හමුවීමේ සතුට බෙදා හදාගෙන දවසේ වැඩ අරඹා ගත වුනේ හෝරා දෙකකටත් අඩු කාලයකි.

**මහ බැංකුව පමණක් නොව, මිහිතලයම කම්පා වූ ලෙසින් ඇසුන දෙදරුම් හඬත් සමග අහස කඩා වැටුනාක් මෙන් අප හිසට ඉහලින් වූ ඉහල මහල් කඩා හැලුනි. විදුලිය නැති වී අඳුරු දුමාරයකින් හාත්පස වැසී ගිය නිසා එකිනෙකා හඳුනාගත නොහැකි තරම් විය. පියෙන් පියට හසු වන්නේ මෙතෙක් සතුටු තෙපුලෙන් එකට සිටි හිතවතුන්ගේ සිදු වූ දැදුරු වූ සිරුරය. කෙනෙකුට සිහිය නැත. සිහිය ඇති අය තම අත පාමිත් තවත් කෙනෙකුව වත්තන් කරගනිමින් මේ මහා බිහිසුණු අනතුරෙන් මිදෙන මගක් අතපත ගා සොයමින් හිතෙන හිතෙන පැත්තට ගාටති. යා යුතු මගක් පැහැදිලි නැතත්, පාවහන් පවා අහිමි දෙපයට වීදුරු කටු පෑගෙමින් ඇවිදගෙන යද්දී හමුවන්නේ විපත්පත් මුහුණුවය. වැටුනු තැන්වල ජීවයෙන් තොර සිරුරුය.**



මුළු කොළඹම උදවුවට පැමිණියත්, උඩින් බිමින් දිය ඉසිමින් ගින්න නිවන්නට තැත් කළත්, පාරේ දුවන සෑම වාහනයක් පාහේ තුවාලකරුවන් රෝහල්වලට රැගෙන ගියත්, අවසානයේ අප ආයතනයේ 41 දෙනෙක්ම ජීවිතයෙන් සමුගෙන ගොස් සිටියහ. දෑස අහිමි වූ දස දෙනෙකි. විවිධ ආබාධවලට ලක් වී රෝහල්ගත වූ විශාල පිරිසකි.

ඒ සියල්ල මැදින් තුවාල නොලබා ජීවිතය බේරාගත් හැමෝම එකතු වී එක ගෙදරක සිදු වූ විපතකදී මෙන් දුක බෙදා හදා ගනිමින් හැකි අයුරින් උපකාර කරමින් විපත් පත් අය බලා හදාගෙන, කඩා වැටුණු මහ බැංකුව නගා සිටුවාලීමට වෙහෙසුනහ. මහ බැංකු පාලනාධිකාරියද දිවි අහිමි වූ අයගේ පවුල්වලට සහ විපතට පත් අයටද උපරිම සැළකිලි පිරිනමන ලදී.



**අද එදාටත් වඩා විසිතුරුව අභිමානවත්ව මුළු දිවයිනෙහිම ප්‍රමුඛතම ආයතනයක් ලෙසින් ආඩම්බරයෙන් යුතුව නැගී සිටින්නේ එදා ඒ බිහිසුනු සිද්ධියේ බිඳ වැටුණු අප විසින් එක්සත්ව එක්සිත්ව ගොඩනැගූ මහ බැංකු මන්දිරය යි. ඒක අපේ හිතට ලොකු ආඩම්බරයක්**

2019 ජනවාරි 31 වැනි දින මෙවරත් අප සිහිපත් කළේ ඒ සොයුරු සොයුරියන්ගේ ආදරණීය ජීවිත 41 යි. ඔබ සැම අපෙන් වෙන් වී වසර 23 ක් ගෙවී ගියද, අපට නම් තාම එය අද මෙන් මතක සිහිනයකි. ඔබ සැමගේ සුහදශීලි ඇසුර - කතාව - සිනහව තාම

(04 පිටුවට)



පැහැදිලි මතකයේ සනිටුහන් වී ඇත. **ඒ ආදරණීය සිහිවටන සෙනෙහසින් පිරිමදිමින් මෙවරද අප ඔබගේ නිසල පිළිරූ ඉදිරියේ මල් කළඹ තබා ඔබේ ඇසුර සිහිපත් කළෙමු.** සසර වසනා තුරා මෙවන් දුකක් ඔබටත් අපටත් නොවේවා යි හදවතින් ප්‍රාර්ථනා කළෙමු.

මහ බැංකු පාලනාධිකාරිය ප්‍රමුඛ බෞද්ධ සංගමය ඇතුළු වත්මන් කාර්ය මණ්ඩලය කිසිදු අඩුවකින් තොරව උපරිම අයුරින් සැමරුම් හමුවට උරදී තිබුණි. උදෑසන සිට සහභාගී වීමට පැමිණි සියලු පිරිසට රිසි සේ ආහාරපාන සපයමින් ඔවුනට ආදරණීය පිළිගැනීමක් ලබා දී තිබුණි.

**අධිපතිතුමන් පැමිණ සිටි පිරිසගේ සවන්පත් මත සිත් සුවපත් වන අන්දමේ සැමරුම් සටහන් තබන ලදී.** දුක් මුසු මතකයන්ගෙන් පිරි සිත්සතන් සනහාලමින් **පෙරහරින් වැඩම කළ මහ සඟ රුවන සිත නිවන දහමක් වදාළහ.** සපිරිකර සංඝගත දක්ෂිණාවෙන් අනතුරුව සහභාගී වූ සියල්ලන් වෙනුවෙන් ප්‍රණීත කාරුණික සංග්‍රහයක් විය. මහ බැංකු කාර්ය මණ්ඩලයේ සංග්‍රහශීලි බව මෙන්ම සුහද පිළිගැනීමද විශ්‍රාමික ප්‍රජාවට මහත් සැනසිල්ලක්ම විය.





**අපේ ආදරණීය හිතවතුන් සමරමින් වසරක් පාසා මෙසේ සිදු කරන මේ සුවිශේෂී සැමරුම වෙනුවෙන් මහ බැංකුවට තුති මල් මිටක් පිරිනමමු....**

**මාලනී විජේසේකර - 0777878012**





# හුස්ම

පරිසර සොඳුරු බව නිති සුරකින හුස්ම
පැහැසර වන අරණ සනහන නෙතු යුග්ම
බිඟු නද විහඟ ගීයට පනදෙන හුස්ම
කොතරම් සුන්දර ද පරිසරයේ හුස්ම

තුරුවැල් මතින් විහිදෙන ජීවන හුස්ම
මිහිමත රැඳි සතුන් දිවි රකිනා හුස්ම
මතු පරපුරට ගෙන දී ජීවන දැක්ම
පරිසර රැකගත යුතුය පනනල ඇති තෙක්ම

ගලනා රිදී ඇල්ලක රඟ දෙන හුස්ම
සයුරේ වෙරළ හැපි හැපි කොඳුරන හුස්ම
විකසිත කුසුම් පෙති මත තවරන හුස්ම
පෙමින් බැඳුන හදවත් මුමුණන හුස්ම

මලිති බටිති විහඟුන් සනසන හුස්ම
මුව මී ගෝන ඇත් වග රැකගෙන හුස්ම
සමනළ සිහින බිළිඳුන් පුබුදන හුස්ම
මල් මල් ළමා ලෝකය සරසන හුස්ම

කෙළිලොල් ළමා විය සිහි නොවෙනා හුස්ම
යෞවන මදය මතයට නොමදෙන හුස්ම
සවිබල බිඳුන දා සිහි එළවන හුස්ම
සතිය වඩන දා මොක් සුව දෙන හුස්ම

**දිබ්බැද්දේ දුල්මන් පීරිස්**
**0715967339**

# ආවර්ජනා....

සෙනෙහෙ සිතින් ළඟ දැවටී හිදිමින්
මොනවද සිහිනෙන් මුමුණනවා
සේයා බොඳවී
සුවඳ තියා යළි වෙන්වෙනවා
සිහිනෙන් ගෑ සුවඳක් වාගේ


වසන්තයේ සඳ සිසිලෙහි පහසින්
හදවිල විකසිත **සුමුදු කුමුදු මල**
උදය නිමාකළ නියදම ලෙස ලොව
මිලිනව වියැකින
සුසුමක දිය කොට

හිරු කුමරුන් එන දවසක මතුදින
කැකුළු සිනා කොද වත සරසාගෙන
**සුදු නෙළුමක් වී**
**විලෙක උයන් තෙර**
**යලි පිබිදේවා සුවද විදා හැර**
**නෙලා ගන්න මගෙ දෝත පුරාවට**




**ඩී.එම්.ජී. දසනායක**
0719248442


1925 වර්ෂයේ ජෝර්ජ් රාජ්‍ය සමයේ දී ශ්‍රී ලංකාවේ නිකුත් කරන ලද රුපියල් දාහක් (1,000/-) වටිනා මුද්දරයක් ලන්ඩන් නුවර පවත්වන ලද වෙන්දේසියක දී රුපියල් ලක්ෂ පහමාරකට (550,000/-) විකිණී ගිය බව වාර්තා වේ. ඒ කාලයේ ශ්‍රී ලංකාවේ නිකුත් කරන ලද ඉහලම වටිනාකම දැරූ මුද්දරය වශයෙන් එය හඳුන්වා දිය හැකිය. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ වික්ටෝරියානු යුගයට අයත් සමහර මුද්දර ඉතාම වටිනා බව කියවේ.





ඉහත සඳහන් මුද්දරයේ පස්වැනි ජෝර්ජ් රජතුමාගේ උඩුකය ඡායාරූපයක් නිරූපණය කර ඇත. ඒ කාලයේ අප රටේ මෙතරම් වටිනාකමක් ඇති මුද්දරයක් නිකුත් කර ඇත්තේ බොහෝ වටිනා විශාල ඉඩකඩම් විකිණීමේ දී හා මිලදී ගැනීමේදී ඉහළ වටිනාකමැති මුද්දර අලවා අවලංගු කලයුතු වීම නිසාය. නමුත් මුලින් සඳහන් ලක්ෂ පහමාරක් වටිනා මුද්දරය, පාවිච්චි නොකරන ලද අළුත් මුද්දරයකි. මෙම අලෙවිය සිදු වී ඇත්තේ 1980 දී පමණය. ලෝක ප්‍රසිද්ධ හිගින්ස් සමාගම 1981 වර්ෂයේ නිකුත් කර ඇති යෝධ මහා මුද්දර නාමාවලියේ එම මුද්දරයට මිල නියම කර ඇත්තේ පවුම් විසිදාහකට ය. (20,000/-)

ඒ කාලයේ පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල් අතුරෙන් රුපියල් දාහක් (1,000/-) වැනි ඉහළ වටිනාකමකට මුද්දර නිකුත් කොට ඇති එකම රට ශ්‍රී ලංකාව යැයි කිව හැකිය.


**හේමා විමලසෝම**
0718328627

# පරම සැපත



සියලුම පව් අත් හරින්න
සියලු කුසල් වඩන්න
සිත පිරිසිදු කරගන්න

මෙය තමයි සැම බුදු පියාණන් වහන්සේලාගේ අනුශාසනාව. එනිසා තම තමාගේ සිත් දෙස විමසිය යුතු කාලය එලඹිලා. දැන් මේ වියපත්ව ඇති අප ඒ ගැන සැලකිලිමත් විය යුතු නේද? කොතෙක් කාලයක් මෙම සසර තුළ අපි ගිලෙමින්ම ඉදිමුද? දැන් කොපමණ කලක්ද? බුද්ධ ශාසන ලක්‍ෂ ගණනක් පහුවෙලා ගියා. මේ ගැන නොසිතූ නිසා සතර අපායට, තිරිසන් ලෝකයට වැටුනොත් නැවත කවදා ගොඩ එන්නද? අප්‍රමාණ කාලයක් එහි කල් යවන්න වෙනවා.

ඉපදීමත් දුකනෙ. කාලයක් මව්කුස තුළ, උපන්දා සිට මැරෙන තෙක්ම විඳින්නේ සැපද? දුකද? ටිකක් සිතා බලන්න. ඇසිපිය හෙලන්නේ දුකට. කේසාන්තයේ සිට පාදාන්තය දක්වා ගලන දාඩිය මුගුරු ඇඟපත දැවිල්ලට නානවා. ඉඳගන්නව සැපයි කියලා. ටික වේලාවකින් දුකට නැගිටිනවා. ඇවිදිනවා ඒත් දුකනේ. නිදිමතට නිදනවා. ඒත් දුකනේ. නැවත නැගිටිනවා. වරින් වර දුක නැති කරගන්න ඉරියව් මාරු කරනවා.

සැප ලබන්න කියලා අපි කරන්නේ ඉරියව් මාරු කිරීම. ඒ මාරු කිරීමෙන් ලැබුණේ සැප උනාට ටික වෙලාවකින් ඒ සැපම තමයි අර දුකට පෙරලෙන්නේ. ''දුක්ඛෙ පටිත්ඨිතෙන ලෝකෙ'' මෙ ලොව පවතින්නේ දුක මතය. කකුල්වල හන්දිපතත් වේදනාව. ඇවිදින්න අමාරුයි. පාද නවන්න දිග හරින්න අමාරුයි. කොන්ද රිදෙනවා. කොන්ද කකියනවා අප්‍රමාණ ලෙඩවල ඉවරයක් නෑ.

හාර්ට් ඇටෑක් කියනවා. කොලෙස්ට්‍රෝල් ඩයබිටික් කියනවා. රෝහල්වල පෝලිම්වල එහෙට මෙහෙට දුවනවා. සිත් ශෝකයෙන් පෙලෙනවා. තරහ නිසා යම් යම් සැර පරුෂ වචනත් විටින් විට දෙසවන් තුලට වැටෙනවා.

මුළු ලොවම අසහනයෙන් වෙලිලා. ප්‍රශ්න නිසා මිනිසුන් ඒ සඳහා විසඳුම් සොයනවා. රට කරවන අය තුලත් ප්‍රශ්න. ඒ ප්‍රශ්න නිසා පාරවල් වල පෙලපාලි. කඳුළු ගෑස්. පොලිසිය කලබල වෙලා. තරුණ තරුණියන් පෙලපාලි. ගල් කැට, ලී කෑලි එහෙට මෙහෙට විසි වෙනවා. විසඳුම් ගුටිකෙලි, සැර පරුෂ වචන වල ශබ්ද විටින් විට දෙසවන් තුල ගැටනවා.

මේ සියලු ප්‍රශ්න වල හේතුව මේ ලොව ඉපදීමයි. උපත නතර උනා නම් ඒ සැපතයි. ඒ සඳහා තමයි අපගේ බුදුපියාණෝ මේ උතුම් ධර්මය චතුරාර්ය සත්‍ය ධර්මය ලොවට දේශනා කොට වදාළේ. අප ඒ මග ගමන් කළොත් ඒ බුදුපියාණන් දේශනා කළ උතුම් නිවන් මඟ සාක්ෂාත් කර ගත හැකියි.

**ආර්.පී.ඒ. ගුණසේකර**
**0332224662**

# ඔවදනක්

දිනි ඇතිතුරා හැමදාමත් එකට ඉමු
දුක් වේදනා සිත් සතුටින් ඉවත ලමු
කල යුතු නොකල යුතු දේ අපි හිතට ගමු
ගත් දෙය ගත්තු තැන තැබුමට පුරුදු වෙමු

දිවි ඇති තුරා හැමදා හැමදාමත් එකට ඉමු
දුක් වේදනා තිබුණත් අපි අපිම වෙමු
දිවි මඟ කෙළවරදී සසරින් එතෙර වෙමු
ගුණදම් වඩවමින් හොඳ දෙය ලොවට දෙමු

නෑ බෑ නොකියමින් ඇති දේ බෙදා කමු
පාන්දරින් අවදිව වැඩපල කර මු
තෙරුවන් නැමද නිති පන්සිල් රකිමු
ගත් දෙය ගත්තු තැන තැබුමට පුරුදු වෙමු

**ආරියදාස තන්ත්‍රීගේ**
**0718064238**

# ජාතික නිදහස...?

## අපි සැමරුවෙමු 71 වෙනි ජාතික නිදහස් දිනයත්...

පරාධීනව සිට ස්වාධීන වූ බොහෝ ජාතීන් වේගයෙන් දියුණුවට පත්වූයේ. පරගැති මානසිකත්වයෙන් මිදී ගොඩ නඟාගත් ''ජාතික චින්තනය'' නිසා බව පැහැදිලිය. (උදා. ඉන්දියාව)


**එහෙත් සිරි ලංකාවේ අපි...?**

*සොයුර, සොයුරියනි මේ සිතන්නට කාලයයි, අපේ අනාගත පරපුර වෙනුවෙන්වත්.*

**එදා 1948 පෙබ. 4 දා මහත් උද්දාමයෙන් අප පිළිගත් ''නිදහස'' පිළිබඳ අතීත සටහන් කිහිපයකි මේ.**


එදා අගමැති ඩී.එස්. සේනානායක මැතිඳුන් ප්‍රථම නිදහස් උළෙලේදී අපේ ජාතික කොඩිය පිළිබඳව මෙසේ ප්‍රකාශ කොට ඇත.

> ''නිදහසේ දිනයේ දී අප උත්සවයක් පවත්වන්නේ නම් අප එසවිය යුත්තේ මේ ධජයයි. මක් නිසා ද? අපේ නිදහස එංගලන්ත රජය විසින් බිලි ගැනීමෙන් පසු එදා පහතට හෙළන ලද්දේ මෙයයි. දැන් බ්‍රිතානීහු අපට අපේ නැති වී ගිය නිහඬස දීමට ලක ලෑස්ති වී සිටිති. මේ නිසා ඒ ධජය ම ආපසු අප එසවිය යුතුය. මෙහි වෙනස්කම් කිරීමට අවශ්‍ය නම් උත්සවයෙන් පසු ඒවා සලකා බැලීම ගැන මගේ විරෝධයක් නැත.''



''1948 පෙබරවාරි 4 වැනි දා මහාමාත්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමා නිදහස් චතුරශ්‍රයේ දී සණ්ඩාර හඬ, වෙඩි හඬ හා රතිඤ්ඤා හඬ මධ්‍යයේ අති උත්සවශ්‍රීයෙන් ඔසවන ලද්දේ මේ කොඩිය යි.''

ඡායාරූපය : **1948 පෙබරවාරි 4** දිනැති Ceylon Daily News පුවත්පතින් උපුටා ගැනිනි.




එම උත්සවයේ ආචාර වෙඩි මුර නිකුත් කිරීම සඳහා බ්‍රිතාන්‍ය නාවික කඳවුරක සිට පැමිණි යුධ නෞකාව

ඡායාරූපය : **1948 පෙබරවාරි 3** දිනැති Times of Ceylon පුවත්පතින් උපුටා ගැනිනි.

**(සැඳෑවේ ඉදිරිපත් කිරීමකි)**

# විශ්‍රාමිකයින්ගේ අත්පොත

## ඔබ අතට

අපේ සාමාජික සාමාජිකයන්ගේ තොරතුරු ඇතුළත් ''විශ්‍රාමිකයන්ගේ තොරතුරු ඇතුළත් 'විශ්‍රාමිකයන්ගේ අත්පොත' පසුගිය දිනක එළිදක්වන්නට අපට හැකිවුනා. අපේ සොයුරු සොයුරියන්, අත් පොත සඳහා අවශ්‍ය තොරතුරු, ඡායාරූප ආදිය නිසි වේලාවට නොඑවීම සහ ඒවායේ අඩුපාඩු (ඡායාරූපවල ප්‍රමාණය ආදිය) සකස්කර ගැනීමට සිදුවීම නිසා කටයුත්ත ටිකක් පමාවුනා. ඡායාරූප රාශියක් පෙළගැස්වීමත් දිගු නාමලේඛනයක් ක්‍රමානුකූලව සකස්කර ගැනීමත් තරමක අසීරු කටයුත්තක්. අපේ කමිටුව වෙනුවෙන් ඒ කටයුත්තට කර උර දුන්නේ අපේ කාරක සභාවේ **කේ.බී. දිසානායක** සහෝදරයා අත්පොත මුද්‍රණය කර ගැනීම සඳහා මුද්‍රණාලය සමඟ සමීපව කටයුතු කර එය හරියාකාරව මුද්‍රණය කර ගැනීමටත් ඔහු සෑහෙන වෙහෙසක් ගත්තා.

හිතවත් දිසා ඔබට අපේ සංගමයේ සහ සියලුම විශ්‍රාමිකයින්ගේ හෘදයංගම ස්තූතිය.




**''අත්පොත'' සංගමයේ සභාපතිතුමාට සහ ලේකම්තුමාට දිසාකරුණා සහෝදරයා විසින් පිළිගැන්වූ අවස්ථාව.**

# Odeal of a STROKE victim

No one want's to believe that in a matter of hours you could laid low by a stroke , lying in bed ,barely able to move or talk .

This is a narration of a victims devastating attack and his unpredictable road to recovery As he leaned against the front door of his house felt odd , not nauseated or faint , simply odd , inside himself and a bit weak . He thought if he lie down in bed he would be all right . When he woke up two hours later and sat down on a chair he found that his right hand was sluggish_and fingers were moving in slow motion . On hindsight he typed Stroke into Google He was unable to say why he typed stroke and not flue or heart attack....



From Google he found common symptoms for stroke - sudden numbness or confusion trouble in seeing properly or walking , dizziness , or severe head ache . He also found several tests like can you raise your arms can you smile ? can you make up and repeat a complete sentence ?

He tested , He lifted his arms above his head and smiled. He was pleased but still feeling tired went back to bed .He thought it was flue , but the image of his uncooperative hand nagged at the back of his mind . Still felt odd , light headed and dizzy . An hour passed stil in bed felt nervous and his symploms persisted.

He was immediately hospitalised . A number of tests were performed. He was asked to touch his nose and follow doctors fingers with his eyes count back words from seven .Made him to squeeze doctors two fingers with each hand and also tested his reflexes. Passed every test. Nevetheless , had to stay in hospital for further observation as there was something in him that set off alarm bells . Doctors observed that he might be having a "stuttering stroke " (Progressive Stroke) He fussed and squirmed in his seat and tried to find a comfortable way to sit and found it impossible.

He then felt light starting to disapper, closing himself in to a tunnel. Soon there was no light.

He felt an absence of everything .He felt terrified and thought he was dying .He slid slowly from his chair on to the floor . Found the room filled with intense white light surrounded by people who lifted him to a stretcher and whisked him in to a treatment room , inserted an IV and attched him to a monitoring machine He found that his movements were no longer voluntary .The lights dimmed . He was alone . He remembered nothing else about that night except vague recollection of being shunted back and forth through a fluorescent glare, never conscious of where he was going. He was sedated or if not he felt he may have plummeted into the black hole that engulfed him.

In the morning the doctors confirmed the diagnosis . He had suffered a stroke . After another thirty six hours doctors told him that he might have been paralysed on one side of his

(09 පිටුවට)

body . His movements were constricted and unable to form words, tongue was heavy and vocal chords twisted . His words were strangled . As he laid in bed his confusion was over powering , vague , alien . Nothing made sense however hard he tried.

The second CT scan revealed that he had in ischaemic stroke - an ohstruction in a blood vessel on the left side of his brain causing paralysis of his right extremities . His blood pressure was very high.

Continuous treatment together with physiotherapy and meditation - focussing on his hand and attempting to travel in his mind , through his arm to the tips of his fingers . he was hopeful of recovering the of his body . Gradually he regained the movement on his damaged side . He was able to repair and rebuild himself and found a place for himself in his reconfigured world.

Risk factors for stroke include high blood pressure , diabetes high cholesterol , sleep aponoea and being over weight. He had every thing to qualify for a STROKE !.

**Parakrama Jayasuriya**
Source : Medical Publications in U.K.

# ගිම්නිවන සැදෑව

ජීවන ගමනෙ තුංමංසල අසල රැඳී
කෙළිලොල් ළමාවිය තරුණෙකු විලස ඇදී
ඉගෙනුම දැනුම ගෙන එන පියසකට වැදී
කාරිය කළා නව අදහස් රටට දිදී




සිත අවිවේක වී ගත වැහැරෙන කාලේ
කටයුතු නිමාකර යන්නැයි කී වේලේ
හැට පිරුණාද? නොදනිමි තවමත් රාලේ
පිරුනා හිත සැදෑවට එක්වුණු වේලේ



හිතවත ගෙවුනු කාලය මතකයට ගෙන
සතුටක් විඳිනු නොහැකිද ආදරය ගැන
රස ඔසුවක් වගේ හද රසවත් කරන
සැන්දෑවට සැදෑවයි ගිම්නිවන තැන

**විජේරත්න අතුකෝරළ**
0775171500





### අපේ ''ගම්පහ'' ඇත්තන්ගේ සද්ක්‍රියාවක්

# ''ඇසූ දුටු පමණින් ගත සිත සැනසේ වඩත්ත සරණංකර සුපින් බිමේදී''

''ගම්පහ දිස්ත්‍රික්කයේ මහබැංකු විශ්‍රාමික සුහද එකමුතුව'' මගින් අපෙන් සදහටම සමුගත්, අපේ පවුලේ නෑදෑයින්ට පිං පැමිණවීම උදෙසා 2019 පෙබ. මස 17 වන දින උතුම් පින්කමක් සිදුකළා. ඒ ආණමඩුවේ, කොට්ටුකච්චියේ අති දුෂ්කර පිරිවෙනේදී''. පිරිවෙනේ ලොකු හාමුදුරුවෝ තමයි, පූජ්‍ය වඩත්තේ සෝමානන්ද ස්ථවිරයන් වහන්සේ. උන්වහන්සේ මේ වනවිට ශාසන උන්නතිය උදෙසා බුද්ධ පුත්‍රයන් වහන්සේලා 100 ක් නමක් පමණ ශාසනයට එකතු කරලා හමාරයි. දෙමාපියන් අසරණ වූ දරුවන් මේ විදියට ශාසනයට එකතුකරගෙන සරණවන්නේ මේ ලොකු හාමුදුරුවෝ තමයි.

දැනට පන්සලේ සාමනේරයන් වහන්සේලා ඇතුලු භික්ෂූන් වහන්සේ 72 නමක් වැඩ ඉන්නවා. තව පිරිමි ළමයින් 55 ක් විතර පිරිවෙනේ ඉගෙන ගන්නවා. ඒ අතරේ මහණ වෙන්න පෙරුම් පුරන කුඩා දරුවන් 7 දෙනෙක් ඉන්නවා. (වයස අවු. 4 සිට) සමහර වේලාවට අර කුඩා දරුවන් ඉන්නේ ලොකු හාමුදුරුවන්ගේ ඔඩොක්කුවේ. හාමුදුරුවන්ගේ අසීමිත කරුණාව, දයාව දැක්කම මට මතක් වුණේ, සෙනෙහස පුදා අම්මාවරුන් වගේ. ඔවදන් දෙවා අගනා මුතු මැණික් වගේ'' යන ගී පද ටිකයි.

ලොකු හාමුදුරුවන්ගේ අවංක වටිනා සේවය ගුණය ගැන මහ බැංකු බෞද්ධ සංගමයේ ලේකම්තුමාට (දැනට විශ්‍රාමික) මීට අවුරුදු 10 ට පමණ කලින් ආරංචි වෙලා ඔහු පන්සලට ගියා. ඔහුට දකින්න ලැබුනේ, කැකිරි හොදියි, බතුයි හිනා වෙවී වළඳන පොඩි හාමුදුරුවන් ඉතාමත් සංවේදී පුද්ගලයෙක් වූ ඔහු මේ පන්සල නගා සිටුවන්න වහා ක්‍රියාකාරී වුණා. පළමුවරට සාමනේරයන් වහන්සේලා 55 නමක් කොළඹට වඩම්මවා මහ බැංකුවේදී හා තවත් කිහිප තැනකදී මහ දන්දී, දින 3 ක් පුරා කොළඹ වැදගත් ස්ථාන නරඹන්න ඉඩ ලබා දුන්නා.

මහ බැංකු බෞද්ධ සංගමයේ හා මහ බැංකු දායක දායිකාවන්ගේ අගනා මූල්‍යමය ආධාරයෙන් ඉතාමත්ම දර්ශනීය බුදු මැඳුරක් වැසිකිලි පහසුකම් මෑත කාලයේදී පන්සලට එකතු වුනා. මේ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළේ අපෙන් සදහටම සමුගත් විමල් ඩයස් මහතායි. මහ බැංකු දායක දායිකාවන් පිරිසක් හැම මාසයේම පළමුවන දින දානය සඳහා මූල්‍යාධාර සපයනවා. මහ බැංකුව ක්‍රියාත්මක කළ කිරි එළදෙනුන් බෙදාදීමේ ව්‍යාපෘතිය යටතේ මේ පන්සලේ දායක ගොවි මහතුන්ට කිරි එළදෙනුන් 35 ක් බෙදා දීමේ පින්කමටත් අපි 2012 වසරේදී සහභාගී වුණා.

ඉතා දිළිඳු ගමක් මැද පිහිටි මෙම පන්සලේ එදිනෙදා කටයුතු පවා කරගන්නේ දහසක් දුෂ්කරතා මැද්දේ.

මෙවන් බුදු පුතුන් රැක ගැනීම මහඟු පින්කමක්? දාන වේලක් පිරිනැමීමෙන් සලාක අමුද්‍රව්‍ය පූජා කිරීමෙන් සිවුරු අඳන බෙඩ් ෂීට් තුවා රබර් සෙරෙප්පු ආදී සෙසු පිරිකර පූජා කිරීමෙන් හෝ බැංකු ගිණුමට මූල්‍යාධාර බැර කිරීමෙන් හෝ පින්කමට දායක වීමට ඔබටක් හැකියාව පහළ වේවා..

විමසීම් : පූජ්‍ය වඩත්තේ සෝමානන්ද හිමි
දු.ක : 0777-843579, 032-3292766

**ගම්පහ මහ බැංකු විශ්‍රාමික සුහද එකමුතුවෙන් කරන ලද මේ මහා පින්කමේදී ද, දසත රැව් පිළිරැව් දුන්නේ මහ බැංකු මාතාවගේ නාමයමැයි.**

''අද වඩත්තේ සෝමානන්ද හාමුදුරුවෝ නම් වූ මම දෙපයින් නැඟී සිටින්නේ මහ බැංකුවට හා එහි සුපින්වත් දායක දායිකාවන්ට පිං සිදුවන්නයි. ඔවුන්ට තුණුරුවන්ගේ ආශිර්වාදය හා දෙව් රැකවරණය ලැබේවා..''

උන්වහන්සේ ඉතාම හැඟීම්බරව තම කෘතවේදීත්වය අපට පළ කළේ ඒ වචනවලින්.

**චන්ද්‍රතිලකා කරවිට**

අපේ මහ බැංකු කවුළුවෙන් එබී බලද්දී දුටු

# "ඉරිසියාකාර ප්‍රේමවන්තයා"



එක් ගීත ප්‍රසංගයක් පැවැත්වෙන අතර වාරයේ එහි එක ගීතයක් හඳුන්වා දෙමින් වික්ටර් රත්නායකයන් කියනවා එය **ඉරිසියාකාර ප්‍රේමවන්තයා** ගේ ගීතය කියලා.

**සඟවා ගනු මැන ඔබෙ රුව සොඳුරියේ**
**අනෙකෙකු නෙත් ඔබෑ මුව මත ගැටෙතැයි**
**මා හද බිය වෙයි - සැලී සැලී යයි....**

**ඉතින්.... කවුද මේ ගීතය ලිව්වේ...**

ගීතය ලීව්වේ **බණ්ඩාර කේ. විජේතුංග. අපේ බැංකුවේ සිටි අපේම සහෝදරයෙක්.** ඔහු ජනාදරයට පත්වුනේ කලාකරුවෙක් විදියට. චිත්‍රපට ප්‍රචාරක පාඨ නිර්මාණය, පූර්ව ප්‍රචාරක පාඨ සඳහා හඬ සැපයීම, ගීත රචනය, ගුවන් විදුලි නාටක, චිත්‍රපට තිර නාටක රචනය ඔහුගේ දක්ෂතා රටපුරා ප්‍රචලිත වූ අංශ. ඒත් අපේ බැංකු කටයුතුවලදී ඔහු අතින් සිංහල භාෂාවට අලුතින් එකතුවී ඇති වචන ඔහුගේ නිර්මාණ ලෙස ප්‍රචලිත නොවුණත්, රටපුරාම එදා වගේම අදත් එකසේ භාවිතයට ගැනෙනවා. අපට දැනගන්නට ලැබී තිබෙන විදිහට පරිගණකය යන්න බණ්ඩාර කේ. විජේතුංග විසින් එසේ සිංහල භාෂාවට අලුතින් එක්කල වචනයක්.

ප්‍රචාරක පාඨ නිර්මාණයෙහිලා බණ්ඩාර කේ. විජේතුංග දක්වා තිබෙන සමත්කම් බැලුවාම ඔහුගේ තැන ගන්න තවම කෙනෙක් බිහිවෙලා නැහැ කියලයි හිතෙන්නේ. 1960 ගණන්වල රන්මුතු දූවෙන් ඇරඹුන ඔහුගේ චිත්‍රපට ප්‍රචාරක කලාව නිර්මාණාත්මක කලාංගයක් බවට පත්වුනේ වැලිකතරින්. මෙම කලාව 1970 දශකය එළැඹීමත් එක්කම ගුවන් විදුලි චිත්‍රප ප්‍රචාරක කලාවේ විශාල පෙරළියක් ඇතිකලා. චිත්‍රපටවල ඔහුගේ නිර්මාණාත්මක පූර්ව ප්‍රචාරක පාඨ ඔහුගේම ගැඹුරු භාවාත්මක කට හඬින් භාවිතයට නොගත් චිත්‍රපට අධ්‍යක්ෂවරයෙක් හිටියා නම් ඒ ඉතාමත්ම කලාතුරකින්.ඔහුගේ හඬ වගේම ඔහු අතින් ලියැවුන ගීතත් සෑම එකක්ම පාහේ ඉතාමත්ම ජනප්‍රියයි.

- සත් සමුදුර තරණය කොට දුරු රටකට වඩින්නියේ මගේ සිතයි මගේ හදයි ඔබත් සමඟ රැගෙන යන්න....
  **(වික්ටර් රත්නායක)**

- ඇයගේ ඇකයෙහි ඔබෙ හිස රඳවා
  සැනහුණු මොහොතක ඔබේම දෙනෙතින්
  මා ඔබ දුටුවා ඇයට නොවේ
  ඔබට පමණි ඔබ ආදරේ
  වසන්ත දෙකොපුල නිදි වැරූ තොල් මල
  දසැඟිලි තුඩු අග පිබිදුණු රණහස
  ඇයට ආදරෙයි ආදරෙයි ......
  **(අමරදේව, වික්ටර්)**

- සබඳකමක් නැති දෙදෙනෙකු වෙමු අපි
  මා තේරුම් ගනු ඔබට නොහැකි නම්
  ඔබ තේරුම් ගනු මටද නොහැකි වේ .....
  **(නීලා)**
- ඉන්දීවරියේ හඬනු එපා
  **(සනත් නන්දසිරි)**
- මගේ සෙනෙහස
  **(සුනිල් එදිරිසිංහ)**
- සුළඟ වගේ ඇවිදින්
  **(නීලා ටී.එම්.)**



මේ ඔහු ලීව ගීත අතරින් කීපයක් විතරයි. රිදී නිම්නය චිත්‍රපටය සඳහා ඔහු රචනා කල **සුළඟ වගේ ඇවිදින් ගීතය 1983 වසරේ හොඳම ගීතය ලෙස ජනාධිපති සම්මානයෙන් පුදනු ලැබුවා.**

**පසු කලෙක බැංකු කටයුතුවලින් ඉවත්ව පූර්ණ කාලීනව කලා ක්ෂේත්‍රයේම නියැලුනු බණ්ඩාර කේ. විජේතුංගයන් බැංකුවේ අපිට විතරක් නෙවෙයි රටටත් ආදරණීය සිහිවටන රැසක් ඉතිරි කොට තබා 1990 ජනවාරි මස අපෙන් සදහටම සමුගත්තා.**

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

## ✶ නිල තොරතුරු

අප කළ ඉල්ලීමක් පරිදි පසුගිය දිනවල සිදුකරන ලද වැටුප් සංශෝධයන්ට අදාල ප්‍රතිශතයන් දක්වමින් පාලන අධිකාරියෙන් ලද ලිපියක පිටපතක් පහතින් දක්වමු.

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
**CENTRAL BANK OF SRI LANKA**

මානව සම්පත් දෙපාර්තමේන්තුව | மனிதவளத் திணைக்களம் | Human Resources Department

18.01.2019

Mr. Jayalal Jayawardena
The President
Central Bank Pensioners Association
104/8, Stanley Thilakarathne Mawatha
Nugegoda.

Dear Mr. Jayawardena,

**Pension Increase Granted in 2018**

This refers to the letter dated 03.01.2019 addressed to the Governor on the above subject.

The percentage increases of the Pension Basics approved by the Monetary Board with effect from 01.01.2018 are as follows.

| Date of Retirement | Proposed Percentage Increase of the Pension Basic |
|---|---|
| Up to 31.01.2006 | 28% |
| 01.02.2006 - 31.01.2009 | 18% |
| 01.02.2009 - 31.01.2012 | 11% |
| 01.02.2012 - 31.01.2015 | 5% |
| 01.02.2015 - 31.01.2018 | 1.5% |

**Director/Human Resources**

(13 පිටුවට)

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය

✶ <u>නිල තොරතුරු</u>

මෙම නිල වසර තුල අප කාරක කමිටුව සාමාජිකයින්ගේ අවශ්‍යතා සහ ප්‍රශ්න වෙනුවෙන් පාලන අධිකාරය හා දිගින් දිගටම සාකච්ඡා පැවැත් වූ අතර අපගේ සාමාජිකයින් වෙනුවෙන් සෑහෙන සේවාවක් ඉටුකරදීමට හැකි වූ බව අපගේ විශ්වාසය යි. වැටුප් ප්‍රශ්ණය සම්බන්ධයෙන් පාලන අධිකාරිය සේවකයින් වෙත ලබාදුන් සහන පිළිබඳව අප සම්පූර්ණයෙන් සෑහීමට පත් නොවූවත් එක්තරා මට්ටමකට සතුටුවිය හැකි ජයග්‍රහයන් ලබාගත හැකිවිය. ඒ කරුණු පිළිබඳව මීට පෙර ද අප විසින් ඔබ දැනුවත් කර ඇත.

**<u>අධිපතිතුමා හමුවීම</u>**

විශ්‍රාමිකයින්ගේ <u>ඉතිරි වී ඇති ගැටළු කීපයක් සම්බන්ධව සාකච්ඡා කිරීමට</u> විධායක කමිටුව කළ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙන් 2019.03.08 වෙනි දින අධිපතිතුමා හමුවීමට අවස්ථාවක් ලැබුණි.

මෙම සාකච්ඡාවට අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි, නියෝජ්‍ය අධිපති එස්.ආර්. ආටිගල සහ ලේකම් දෙපාර්ත- මේන්තුව, මානව සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව හා කාර්ය මංඩල (සුබ සාධක) දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරි මහතුන් කිහිප දෙනෙකු සහභාගී වූ අතර අප කාරක කමිටුව වෙනුවෙන් සභාපති ජයලාල් ජයවර්ධන, ලේකම් තන්ත්‍රීගේ, භාණ්ඩාගාරික ආර්.ඩී. ගුණසේන, ඥාණා රණතුංග, ලීලා මෝහන් සුන්දරම්, ඒ.එම්.යූ. ටිකිරි බණ්ඩා සහ ජගත් කාරියවසම් යන අය සහභාගී වූහ.

**<u>එම සාකච්ඡාවේ ප්‍රතිඵල සම්පිණ්ඩනය</u>**

**විශ්‍රාම වැටුප් සංශෝධන**

- <u>කමිටුව ඉදිරිපත් කළ කරුණු</u>

○ සංගමයේ මහා සභා රැස්වීමේ දී යෝජනා කළ පරිදි වැටුප් ක්‍රමය සකස් නොකිරීම පිළිබඳ සංගමයේ කණගාටුව පලකළ අතර සංගමය ඉල්ලා සිටි පරිදි වැටුප් යාවත්කාලීන කළේ නම් අනාගතයේ දී වැටුප් විෂමතා ඇති නොවන බව සහ වැටුප් සම්බන්ධව පාලක පක්ෂය හා වරින් වර සාකච්ඡා අවශ්‍ය නොවන බවත්, අප විසින් විශේෂයෙන් පෙන්වා දෙන ලදි.

○ 2018 වැටුප් වැඩි කිරීමේ දී ඇතැම් සේවක කොටසකට අසාධාරණයන් සිදු වී ඇති බව සංඛ්‍යා සහ වැටුප් පත්‍රිකා ඉදිරිපත් කරමින් උදාහරණ සහිතව කරුණු ඉදිරිපත් කෙරිණි.

○ 2000 වසරේදී වැරදි වැටුප් තල මත සිටි අයට එම විෂමතා නිවැරදි කිරීමකින් තොරව එම තලයේ ම ප්‍රතිශතයන් ලබාදීම නිසා වැටුප් ව්‍යුහය තවදුරටත් ව්‍යාකූල වී ඇති බවද පෙන්වා දුන්නෙමි.

ඉදිරිපත් කළ සියළු කරුණු පිළිබඳව ඉතා සාවධානව සවන් දුන් අධිපතිතුමා මෙකී කරුණු පිළිබඳව සොයා බලා සුදුසු කටයුතු කරන ලෙස නියෝජ්‍ය අධිපති ආටිගල මහතාට පැවරු අතර ඉදිරිපත් කළ සියළු විස්තර නියෝජ්‍ය අධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලෙස සංගමයට උපදෙස් දුන්නේය

**<u>වෛද්‍ය ප්‍රතිලාභ</u>**

- වත්මන් ආර්ථිකයට ගැලපෙන අයුරින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා වූ ගෙවීම් වැඩිකර ඇති අතර චක්‍ර ලේඛය නිකුත් වූ විගස විශ්‍රාමිකයින්ගේ පඩිපත සමඟම එම තොරතුරු විශ්‍රාමිකයින්ට පුද්ගලිකවම දන්වන බව ප්‍රකාශ කෙරිනි.

- හෘද කැක්කුම්, මොලේ සැත්කම් සඳහා දැනට අනුමතකොට ඇති මුදල් ප්‍රමාණයෙන් කොටසක් භාවිතා කිරීමෙන් අනතුරුව යම් මුදලක් ඉතිරි වේ නම් එම මුදල ඉතිරි අවස්ථාවක දී එවැනිම ශල්‍යකර්මයක් සඳහා භාවිතයට ගැනීමට සලස්වන ලෙස කළ ඉල්ලීම ගැන සොයා බලා කටයුතු කිරීමට සුභ සාදක අංශයට පැවරුනි. (14 පිටුවට)

- මෙතෙක් කැට් cat – CED ක්‍රමයට බැඳී නැති විශ්‍රාමිකයනට නැවත එම ක්‍රමයට බැඳෙන්නට අවස්ථාවක් ලබාදෙන ලෙස කළ ඉල්ලීම පිළිබඳව ක්‍රමවේදයක් සකස් කරන මෙන් සුභසාධක අංශයට භාර කිරීම.

**ආරක්ෂක අංශයේ ගැටළු**

ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ඇතැම් සේවක කොටස්වලට සිදුවී ඇති අසාධාරණයන් පිළිබඳව කමිටුව ඉදිරිපත් කළ කරුණු අධිපතිතුමාගේ දැඩි අවධානයට ලක්වූ අතර එම කරුණු පිළිබඳව සොයාබැලීමට මානව සම්පත් දෙපාර්තමේන්තුවට උපදෙස් දුන් අතර ඒ ඒ පාර්ශවයන් විසින් අදාල තොරතුරු ලිඛිතව මානව සම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලෙසත් දැන්වීය.

**විශ්‍රාමිකයනට බැංකු රථගාල භාවිතය**

අප කමිටු රැස්වීම් පවත්වන දිනයන්හි පමණක් කමිටු නිලධාරීන් තිදෙනෙකුගේ වාහන පමණක් රථගාලේ නැවැත්වීමට අවසරදීමට අධිපතිතුමා එකඟ වූ අතර ඒ පිළිබඳ ලිඛිතව ඉල්ලීමක් මානව සම්පත් දෙපාර්තමේන්තුවට යොමුකරන ලෙස ද දැක්වීය.

**නිවාඩු නිකේතන**

කතරගම, නුවරඑළිය, අනුරාධපුරය නිවාඩු නිකේතනවල කාමර ලබා ගැනීමේ දී විශ්‍රාමිකයින්ට ඇතිවන දුෂ්කරතා ගැන කළ කථා බහේදී කාමර ලබාදීම ප්‍රමුඛතා ලැයිස්තුවක් මත සිදු කරන ලෙස අධිපතිතුමා අදාල අංශ වෙත උපදෙස් දුන්නේය.

# ඇස් හරින්නට කාලයයි... මේ



ගාමිණී පැරකුම් මහසෙන් ගජබා වීර අපේ නිරිඳුන්
සමුදුර වැනි වැව් විස්මිත ඇල දොල හැදු අපේ නිරිඳුන්
සිව් හෙළයම බව බෝගෙන් පොහොසත් කළ නිරිඳුන්
මුළු ලක එක සේසත් කළ වී එඩිතර නිරිඳුන්

ගුණ දහමින් පිරි මිනිසුන්ගෙන් පිරි මගෙ රට සිරි ලංකා
සාගරයක් මැද මුතු ඇටයක් ලෙස බැබලුන රට ලංකා
කාහටවත් අත නොපා දියුණු වු මගෙ රට සිරි ලංකා
එවන් අසිරිමත් රටකට වූ දේ කිමද කිමද ලංකා

නැව් එනතෙක් සමුදුර දෙස බලා සිටින ලංකා
නෙලා ගත්තු එල අලෙවි කරන්නට විදියක් නැති ලංකා
නිදියන පැදුරත් එතෙරින් එනවා අනේ මගේ ලංකා
දැයම වෙලා සිටි ඒ අභිමානය කොහිද ගියේ ලංකා


අල්ලස් දූෂණ රජය යි දින දින රටම වටේ ලංකා
අපචාරය සහ භීෂණ නෙක නෙක හිස ඔසවන ලංකා
මත් කුඩු මත්පැන් දෝරෙ ගලාලා රටම නසයි ලංකා
සොබාදමත් අද හඬා වැටෙනවා බැලු අතේ ලංකා

**අපිත් එකතුවෙමු අපේ කිව්ඳියගේ මේ පැතුමට....**

රට නැවතත් ගොඩනගන්නට අපි නොපමා වෙමු ලංකා
හඳුනාගෙන දැය නැසුවන් පිටුදැක පෙරටම යමු ලංකා
දැයට හිතැති සැම වීර තෙදැති ජන අත්වැල් බැඳ ලංකා
යළිත් අපේ රට දරුවන්ට නගාදෙමු සුන්දර මගේ ලංකා

**සුමිත්‍රා නෙල්සන් - 0714985235**

# ජාතික ප්‍රශ්ණයක් බවට පත්ව ඇති ඖෂධ මාෆියාව



ඖෂධ සමගින් සමීප සබඳතාවයක් පවත්වන පාරිභෝගිකයන් අතරින් වැඩි කොටසක් විශ්‍රාමිකයන් බව කීවොත් නිවැරදිය. විශ්‍රාම වැටුප ලබාගත් විගස බොහෝ දෙනෙකු නතරවන්නේ ලගම ඇති ඔසුසල සමීපයේ බව අප අත්දැකීමෙන් දන්නා කරුණකි.

**අද අපට අත්විඳින්නට ඇති කනගාටුදායකම කරුණ වන්නේ වෛද්‍යවරයා ලබාදෙන බෙහෙත් වට්ටෝරුවේ ඇති ඖෂධ වෙනුවට බොහෝ ඔසුසැල් වෙතින් ආදේශක ඖෂධ රෝගීන්ට ලබාදීමට කටයුතු කිරීමයි.** මේ හේතුවෙන් තමාට ලැබෙන්නේ නිවැරදි ඖෂධය ද, අදාල ගුණාගුණ ලැබේද, මිලෙහි පවතින අඩු වැඩිවීම් පොකැට්ටුවට බලපාන්නේ කෙසේද යන ගැටලු රැසක් අතරේ අතරමං වෙයි.

අප දක්ෂ වෛද්‍යවරයෙකු හමුවී විස්තර පවසා රෝග විනිශ්චය කිරීමෙන් අනතුරුව ලබාගන්නා ඖෂධ වට්ටෝරුව පිලිබඳ අවසාන තීරකයා වන්නේ ඔසුසැල් සේවකයා නම් අසරණ රෝගීන් පත්වන බේදජනක තත්වයට වගකිව යුතුවන්නේ කව්ද?

**මහාචාර්ය සේනක බිබිලේ මැතිතුමා විසින් සැකසූ ඖෂධ නාමයෙන් බෙහෙත් ලිවීම ප්‍රතිපත්තියක් සේ වෛද්‍යවරුන් අනුගමනය කරන්නේ නම් ඖෂධ වෙළදාම හරහා අසරණ රෝගීන් ගසාකෑම නතර කිරීමට හැකිවනු ඇත.**

නිරෝගී සුවයෙන් සිටීම සම්බන්ධව ප්‍රබල සංනිවේදනයන් පැවතුනද ලෝ පුරා විශාල පිරිසක් තමන්ට වැළදී ඇති රෝග වෙනුවෙන් ප්‍රතිකාර ලබාගැනීම මඟ හරිමින් සිටින බව එක්සත් ජාතීන්ගේ වාර්තාවලින් පැහැදිලි වේ.

**රෝගවලට ප්‍රතිකාර ලබාගන්නට වත්කමක් නැති ලෝ පුරා වෙසෙන රෝගී ජනතාව එයින් මුදවාලීමට බොහෝ රටවල රජයන් හා මහජන සුභ සිද්ධිය තකා කටයුතු කරණ සංවිධාන පෙරමුණ ගෙන ඇත.**

අප රට ඉරණම කොතැනද? රජයේ හා පෞද්ගලික රෝහල් පිළිබඳව ද සේවාවන් හා ප්‍රතිකාර පිළිබඳවද විවාදාත්මක තත්වයක් පැණනැගී තිබෙන මොහොතක රෝගීන් සුවපත් කිරීම වෙනුවෙන් දැරිය හැකි පිරිවැය සම්බන්ධයෙන් ද අපගේ සැලකිල්ල යොමු කල යුතුව ඇත.

අප රට තුල අඩුම තරමේ ඔසුසැල් 4000 ක් පමණ ඇති බව සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාල වාර්තාවලින් දැක්වෙයි.

එහෙත් එම ඔසුසැල් ප්‍රමිතියට අනුකූලද? රජයේ නියමයන්ට අනුව අවම වශයෙන් ඔසුසැලක් වර්ග අඩි 180 ක් යුතු විය අතර වායු සමීකරණ හා ශීතකරණ පහසුකම් තිබිය යුතුය. එහෙත් අප රට තුල ඇති ඔසුසැල් වලින් මෙම මූලික පහසුකම් හෝ සපුරා ඇත්තේ කීයෙන් කීයක්ද? කල් ඉකුත් වූ ඖෂධ පිළිබඳ පරික්සුම් කොතරම් දුරට ඉටුවේද? නිරෝගි ජනතාවක් උදෙසා සෞඛ්‍ය බලධාරීන් මෙපරිද්දෙන් නිද්‍රාශීලිව අදාල පියවරයන් නොගෙන සිටීම තුලින් අධික පිරිවැයක් දරමින් ඒවා නිවැරදි කිරීමට සිදුවන්නේ ඔවුන්ටම බව ඔවුන් වටහා නොගන්නේ ජාතියේම අවාසනාවට විය යුතුය.

නිරෝගී ජනතාවක් එරට ආර්ථිකයට, සංවර්ධනයට මහඟු මෙහෙවරක් සිදුකරන බව විද්වතුන්ගේ මතයයි.

එමෙන්ම රටට දැයට මහඟු සේවයක් ඉටුකොට විශ්‍රාම සුවයෙන් කල්ගත කරන විශ්‍රාමික ප්‍රජාව නිරෝගී සුවයෙන් තබා ගැනීම. අවම මිලකට ඖෂධ මිලදී ගැනීමට හැකියාව. ඖෂධීය නාමයෙන් ඖෂධ වට්ටෝරු ලබාදීමෙන් වෙළඳ නාම යටතේ විකුණන ඖෂධයන්ට වැට බැඳීම, කල් ඉකුත් වූ ඖෂධ අලෙවිය පිළිබඳ දැඩි නීති පැනවීම, අවැසි ඖෂධ පමණක් ආනයනය කිරීම, අප රට තුලද අවැසි ඖෂධ ආනයනය කිරීම, අප රට තුලද අවැසි ඖෂධ නිෂ්පාදනය හා ඖෂධ වෙළඳපොල අක්‍රමිකතා පිළිබඳව පාරිභෝගිකයන් සන්නිවේදන ක්ෂේත්‍රයක් හරහා නිරතුරුව දැනුවත් කිරීම හා විධිමත් පසුවිපරම් මගින් රෝගී ජනතාව ආරක්‍ෂා කල යුත්තේමය.

**එවන් ක්‍රම මගින් රෝගී ජනතාව වෙලාගෙන ඇති ඖෂධ මාෆියාව ක්‍රම ක්‍රමයෙන් අඩුකර ගත හැකිවන බව අපේ විශ්වාසයයි. රට ජාතිය නාමයෙන් මෙය ජාතික ප්‍රශ්නයක් වශයෙන් ගත යුත්තේමය.**

**ජගත් කාරියවසම්** - 077 9507184

# ගැමි නිවස

**අපේ සිංහලකම පිරුණු**
**ගෙදරකට දීග යන**
**දියණියක් ගැනයි**
**අපේ මේ කවියා කියන්නේ.**
**මේ කවි පෙළ පහළින් ඇති**
**දීග යන දියණියට ඔවදන්**
**කවිපෙළත් එක්ක**
**සසඳා බලන්නකෝ.**



දුව යන නමින් මව් පියෝ ඇසුරෙහි ගැවස
රුව ගුණ නැණින් වැඩි යුවතිය මතු දවස
විවහව නෑසියන් හැර යන දුක පවස
දුව යනු මෙන්ය පිවිසෙනු තම හිමි නිවස

කම් නැත බිරිඳකට තම හිමිගේ ගෙදර
ඈතක පිහිටියද නුපුරුදු අය අතර
යම් සේ එක් වෙයිද මාලුව සහ වතුර
බැන්දේ බිරිඳ ගෙදරට සතු හිමි සොඳුර

ගෙය හැර ගියද නිවැසියො වෙනතක් බලලා
ගෙට හිතවත්ය එය අත නොහරිය බලලා
පෙම් ලද බිරිය නොතකා එහි දිග පලලා
ගෙදරට ලැදිය පවුලේ යහපත පතලා

අඟනුන් වැඩි දෙනා සමගින් සැම පිරිමින්
වෙති හිමි නිවසේ බැඳි සමගියෙන් රන්වූ දමින්
ලැබ දරුවන්ද උන් ඇති දැඩි කරද පෙමින්
රකිනා අපූරුව එකකෙ පවුල නමින්

දෙගුරුන් නෑසියන් සැමගෙන් වෙන් වීලා
බිරිඳක් අගෙයි හිමි හට එක්වන ලීලා
සැමියා සමඟ දරුවන් ඇති දැඩි කරලා
ඇය මිය යන්නේ හිමි නිවසෙයි මහලු වෙලා

**ඩබ්ලිව් සී.ඒ. රේමන්ඩ්**

# දීග යන දියණියට...
# කාලීන ඔවදන්


**දීග යන දියණියකට අපේ මේ කවියා ඔවදන් දෙන්නේ අමුතුම විදිහකට.**
**මේ කවි පෙළ, ඉහළින් ඇති ගැමි නිවස කවිපෙළ හා සසඳ බලන්නකෝ.**

දියණියනි හෙට දින
හිමි සමග අතිනත ගෙන
යන ඔබට මා දෙන
මෙ සැම ඔවදන් සිතට ගනු මැන

හිමිගෙ ගෙට යන්නේ
එනිවස ඔබේ වන්නේ
මෙය සිතට ගන්නේ
ඔබයි අදිපති ගෙදර උන්නේ

නැදි මයිලනට නතු
නොවී කල්ගත කළ යුතු
ගෙයි සියළු කට යුතු
ඔබේ යටතට විගස ගත යුතු

පතොක් කටු ඇ යුතු
වල් හබුරු කොළ සුදු රතු
සමඟ ක්‍රෝටන් අතු
ටින් කබල්වල වවා ගත යුතු



නාබියද දක්වා
කලිසම දනිස දක්වා
සළෙළු දන එක්වා
සිනාසෙනු දත්පෙළම දක්වා

නිදියනු පළමු කොට
පිබිදෙනු සැමට පසු වට
අහර පිස දීමට
අණකරනු මැන ඔබේ සැමියට

ගෙයි ගිනි පිටට දෙනු
පිටත ගිනි ගෙදරට ගනු
ගෙයි සියලු ගනු දෙනු
ඔබට සතු බව සොඳින් දැන ගනු

නොකියා තම හිමිට
කුමටද උතුරු සළුපට
ගමන් ඉක්මන් කොට
යන්න ඔබහට කැමති තැනකට

**පී. වත්තේගම** - 2864505

# සිනා !



ගුරුතුමා : රෝග තැනින් තැන පතුරුවන කෙනා හඳුන්වන නම මොකක්ද?

සිසුවා : රෝග වාහකයා සර්

ගුරුතුමා : එතකොට අවි රැගෙන තැනින් තැන යන කෙනාට මොකක්ද කියන්නේ?

සිසුවා : අවිවාකයා

---

කමල් සිටියේ මරණාසන්නවය. ඔහු ඉතා අසීරුවෙන් අතක් ඔසොවා බිරියට කථා කළේය.

කමල් : මගේ මරනේ ගැන ඔයා දුක්වෙන්න එපා.

කොනේ ගෙදර කාන්ති එක්ක මගේ ලඟ සම්බන්ධයක් තිබුණා. ඒක ඇත්ත. ඔයා මට සමාව දෙනවා නේද?

කාන්ති: ඔයා ඒ ගැන කනගාටු වෙන්න එපා කමල් මං ඒක හොඳටම දැනගෙනයි හිටියේ. නැත්නම් ඔයාට වහ දෙන්න මට වෙන හේතුවක් තිබුනේ නැහැනේ. මටත් සමාවෙන්න.

බිරිය කමල් සනසමින් කීවාය.

---

ශල්‍ය වෛද්‍යවරුන්ගේ සුහද හමුවකදී එකම වෛද්‍ය පීඨයේ එකම කාලයේ උගත් මිතුරන් තිදෙනෙකු හමුවී මධුවිත තොලගානා අතරේ රැකියා ක්ෂේත්‍රය පිළිබඳවද කථාබහක් ඇතිවිය.

පළමු වෛද්‍යවරයා : මම නම් කැමති ඉලෙක්ට්‍රිකල් ඉංජිනියරින් ෆීල්ඩ් එකේ අය ඔපරේෂන් කරන්නයි. මොකද කීවොත් ඇඟ ඇතුලෙත් කලර් කෝඩ් විදියට තියෙන නිසා කරදර නෑ.

දෙවන වෛද්‍යවරයා: මම නම් ආසම ගුරුවරුන්ව ඔපරේෂන් කරන්න තමා. මොකද කාලසටහන් වගේ ඇතුලේ හැමදේම පිළිවෙලට තියෙනවා. ඉන්ටර්වල් වේලාවට අපිට පොඩ්ඩක් රෙස්ට් කරන්නත් පුලුවන්.

තුන්වන වෛද්‍යවරයා: මම නම් ආසම පොලිටිකල් ෆීල්ඩ් එකේ ඉන්න අය ඔපරේෂන් කරන්න. මොකද කීවොත් කිසිම එකක් පිළිවෙලට නෑ. කට තියෙන්නේ පස්ස පැත්තේ මොලයක් ඇත්තෙම නෑ. නහය තියෙන්නේ බඩේ. ඇස් තියෙන්නේ ඉස් මුදුනේ. කොයි විදියට ඔපරේෂන් කළත් ප්‍රශ්නයක් එන්නෙම නෑ.

**ජගත් කාරියවසම්**

---

රුවන්වැලිසෑය කළේ කවුද? මෙම ප්‍රශ්නය ගුරුතුමා පළමුවෙන්ම යොමු කළේ ගුණපාලටය. ඔහු ගත් කටටම කීවේ ''මම නෙවේ'' කියාය. ඒ එය වැරදි ක්‍රියාවකැයි ඔහුට හැඟීගිය හෙයිනි. සිසුහු එකිනෙකාගේ මුහුණ බලන්නට වූහ. ගුණපාලට ගුරුතුමාගෙන් වේවල් පහරක්ද වැදිණ.ගුරුතුමා ගුණපාල කැඳවා පසුදින පියාත් සමඟ පාසලට එන ලෙස දැන්වීය.

ගුණපාල ගෙදර ගොස් ඒ බැව් අප්පච්චීට දන්වා පසු  දින අප්පච්චීත් සමඟ පාසැලට ගොස් ගුරුතුමා හමුවිය. ගුරුතුමා අප්පච්චීට රුවන්වැලිසෑ ප්‍රශ්නයත්,  පුත්‍රයාගේ පිලිතුරත් යොමු කළේය. අප්පච්චී ගත් කටටම කීවේ තම පුත්‍රයා කිසිවිටෙක බොරු නොකියන බවත්, ඔහු එය කළානම් ඒ බැව් තමාට හෝ අම්මාට කියන බවත්ය.

වැරදිලාවත් මගේ පුතා එහෙම දෙයක් කර තිබේ නම් ඔහුට සමාව දෙන ලෙසත් දෙකට නැමී ඉල්ලා සිටියේය. පියාගේ දැනුම ගැනද කම්පාවට පත් ගුරුතුමා ''හා හොදයි මම දරුවාට දඬුවම් කරන්නේ නැහැ... ඔහේ දැන් ගෙදර යන්න.'' යයි සානුකම්පිතව පැවසීය.

**පී.එම්. සෙනෙවිරත්න**

# මොකක්ද මේ LLB?




''හලෝ! මාර්තු 1, 2, 3 විශ්‍රාම සංගමයේ දින තුනේ චාරිකාව ත්‍රිකුණාමලයට යනවා. ඒකට යන්න නෝනත් එක්ක එනවා නේද?''

''දින තුනක් නේද? අපි දෙන්නම L L B කරනවා නේ. මම ලොකු දුවගේ ගෙදර. නෝනා පොඩි දුවගේ ගෙදර. අපිත් කැමතියි පරණ යාලුවොත් එක්ක එකතුවෙලා විනෝද ගමනක් යන්න. ඒත්... නිවාඩුවක් නැහැනේ.''

මගේ මිත්‍ර රංජන්ට කතාකර ඔහුගේ පිළිතුරෙන් පසුව මා එම දුරකථන ඇමතුම විසන්ධි කර ඊළඟට ඇන්තනිට කතා කළෙමි.

''හලෝ! මේ සැරේ අපි දවස් තුනක් ගලෙන් බැන්ද කොටුව, ත්‍රිකුණාමලයට විනෝද චාරිකාවක් මාර්තු මුල සතියේ යනවා. දෙන්නාම එනවා නේද ඒකට සහභාගී වෙන්න. සංගමයෙන් විස්තර පත්‍රිකාවකුත් එවලා ඇති.''

''දවස් තුනක් නම් කොහොමවත් යන්න බැහැ. අපි විශ්‍රාම ගත්තට පස්සේ L L B කරන්න පටන් ගත්තනේ. මම පුතාගේ ගෙදර. නෝන දුවගේ ගෙදර. මහ බැංකුවේ වැඩ කරන කොට නම් නිවාඩු ගන්න එක ලේසියි. දැන් කොහොමත් නිවාඩු ගන්න බැහැ.''

මහ බැංකුවේ සේවය කළ බොහෝ දෙනෙකු උගත් බුද්ධිමත් අය බව අපි දනිමු. ඒ අය අතුරින් බොහෝ දෙනෙකු විශ්‍රාම ගිය පසුව L L B කරන බව ඉහත පිළිසඳර වලින් ප්‍රකාශ විය. මේ හැරුන විට මා හා කතාකළ තවත් මිතුරියක් තව මාස තුන හතරකින් L L B කිරීමට සූදානම් වන බවත් එවිට විවේකය අඩුවී පොදු කටයුතු සඳහා කැප කරන කාලය අඩුවිය හැකි බවත් මා හට පැවසීය.

L L B යන වචනය භාවිතා කොට මට පිළිතුරු දුන් තිදෙනාම L L B යන වචනය උච්ඡාරණය කළේ හාස්‍යයද මුසුකොට එයින් ගම්‍යවන වෙනත් අරුතක් ද ඇතිව බව හැගෙන ආකාරයෙනි. ඔවුන් ඒ අරුත දැන සිටියද මා නොදැන සිටියෙමි. එහෙයින් නැවතත් ඔවුනට කතාකොට මේ L L B කතාව කුමක්දැයි විමසුවෙමි.

L L B යන්නෙන් අදහස්කොට ඇත්තේ අනෙකක් නොව

(L) ළමයින්ගේ (L) ළමයි

(B) බලාගැනීමයි.

මෙය එක අතකින් සමාජශීලි සත් ක්‍රියාවකි. අතීතයේ සිටම දරුවන් දෙමාපියන්ට වඩා ආතාට ආත්තම්මාට ආදරය කරමින් ඔවුන්ට සමීප වෙමින් කවි කතන්දර අසමින් හැසුරුන අයුරු අප අසා දැක ඇත්තෙමු.

මොබයිල් ෆෝනයට, වීඩියෝ ගේම් වලට, රූපවාහිනි පෙට්ටියට වඩා ඔවුන්ගේ ඇසුර දරුවන්ගේ යහ ගුණ වැඩීමට වටිනේය. එම නිසා විශ්‍රාමිකයන්ගේ මේ L L B කිරීම වටිනා සමාජ මෙහෙවරකි.

එමෙන්ම දරුවන් ඇසුරෙන ලැබෙන සතුට මේ වියට ගැලපෙන ඔසුවකි.

**එහෙත් විශ්‍රාමික අපි LLB කරන අතර අපේ අනන්‍යතාවය ද තබාගත යුතුය.**

**අඹු සැමි සබඳතාව, නිදහස, සතුට, චාරිකා, පොතපත කියවීම, ඥාති හා හිතමිත්‍ර සබඳතා, සමාජ සංවිධාන අතර සබඳතා, ආදිය ඉහත LLB සඳහා යට කිරීමට හෝ සීමා කිරීමට ඉඩ නොදිය යුතුයි.**

අපි පූර්ණ මිනිසුන් වන්නේ එසේ වුවහොත් පමණි.

**එමෙන්ම වැඩිහිටි පරපුරේ මෙම දායකත්වය අපගේ සිංහල සංස්කෘතියේ විශිෂ්ඨ උපාංගයක් බව අප කිසිවිටකත් අමතක නොකළ යුතුය.**

(සත්‍ය අත්දැකීමකි. නම් ගම් මනඃකල්පිතයි)


**ඒ.ඩබ්.යූ. ටිකිරිබණ්ඩා**
**0714433056**

# කරාටේ

කරාටේ ආත්මාරක්ෂක සටන් ක්‍රමයක් වශයෙන් මුලදී ලොව පැතුරුනත් අද එය ක්‍රීඩාවක් වශයෙන් මුලු ලොවම පිළිගෙන ඇත. මේ නිසා එහි පදනම අද වෙනස්වී ඇති අතර එහි නීති රීතිද අද වෙනස් වී ඇත.

ලොව පිළිගත් ක්‍රීඩා කරාටේ සංවිධාන කිහිපයක්ම අද ලොව පුරා ක්‍රියාත්මක වන අතර ලංකාවේද ක්‍රීඩා අමාත්‍යාංශය පිළිගත් ශ්‍රී ලංකා කරාතේ දෝ සම්මේලනයේ මම ද සාමාජිකයෙක්මි.

කරාටේ ශිල්පයේ පරමාර්ථය ලෙස ආත්මාරක්ෂාව සඳහන් වුවත් නූතන කරාටේ ශිල්පයේ පියා වශයෙන් සැලකෙන ඔකිනාවන් ජාතික මහාචාර්ය ගීචින් ෆුනකෝෂි කියා ඇත්තේ පුහුණුව කළ යුත්තේ මිනිසාගේ කායික මානසික අධ්‍යාත්මික දියුණුව උදෙසා බවයි. මේ නිසා ඔහු කරාටේ ක්‍රීඩකයෙකුට හිත දියුණු කිරීම සඳහා භාවනාව අනිවාර්ය්‍යය කර ඇත.



කරාටේ ගැන මෙහෙම ලියන්නේ අපේ රටේ අංක එකේ කරාටේ ශූරයෙක්. ඔහු නමින් එම්.බී.ඩී. සිල්වා. විවිධ ක්ෂේත්‍ර තුළ දිය දද නැංවූ ශූරයින් අපේ මහ බැංකුව තුළ කවදත් සිටියා. එම්.බී.ඩී. අපිට හිටිය එවැනි ශූරයෙක්. වටිනා පුද්ගලයෙක්. සියල්ලට වැඩිය ඔහු යහගුණ පිරි ''හොඳ මනුස්සයෙක්''

ඔහුගේ කරාටේ ජීවිතය වෙනුවෙන් ඔහු ලද ගරු බුහුමන්, සම්මාන පිළිබඳව මාධ්‍ය තුළින් වරෙක පළවූ සටහනක් ඔබේ නෙතට.


ලංකාදීප

2017 අගෝස්තු මස 05 වැනිදා සෙනසුරාදා

## කරාටේ ක්‍රීඩාවට කළ සේවයට කළු පටි 10 වැනි ශ්‍රේණිය ලබයි

ශ්‍රී ලංකා කරාටේ සංවිධානයේ නිර්මාතෘ සහ එහි ප්‍රධාන උපදේශක එම්.බී.ඩී. සිල්වා මහතා වසර 50 කට අධික කාලයක් කරාටේ ක්‍රීඩාවට කළ සේවය අගයමින් ජපානයේ කරාටේ ජ්‍යෙෂ්ඨ උපදේශකයන්ගේ සංගමය කළු පටි 10 වැනි ශ්‍රේණිය ඔහුට පිරිනැමීය.



කරාටේ ශිල්පියකුට ලබාගත හැකි ඉහළතම ශ්‍රේණිය කරාටේ කළු පටි 10 වැනි ශ්‍රේණිය වන අතර එම ශ්‍රේණිය ලැබූ ශ්‍රී ලංකාවේ පළමු වැනියා බවට ද එම්.බී.ඩී. සිල්වා මහතා පත්විය.

ජාතික කරාටේ දෝ සම්මේලනය පසුගියදා ඒ මහතාට නිල වශයෙන් කළු පටි 10 වැනි ශ්‍රේණිය ප්‍රදානය කළ අතර කරාටේ මතක සටහන් ග්‍රන්ථය ද එහිදී එළිදැක්වීය. (20 පිටුවට)

**පසු පිටෙහි සඳහන්ව ඇති දකුණු ආසියා කරාටේ ශූරතා තරඟය වෙනුවෙන් නිකුත් වූ සමරු කලාපයේ අපේ ශූරයා ගැන සඳහන් වූයේ මෙසේය.**

A Karate Living Legend in Sri Lanka – 10th Dan Black Belt First and Only South Asian Grand Master M.B.D. Silva

Sensei M.B.D. Silva, who is 85 years old now is the living Karate Master in Sri Lanka, who was a pioneer in establishing Karate in Sri Lanka 60 years ago.

Master M.B.D. Silva first learned Karate under reputed Karate Instructor, Master G.A.T. Livera of Negombo. Later Master M.B.D. Silva learned Karate under Grand Master Chew Choo Soot, Head of Karate Budokan International Malaysia and obtain 2nd Dan Black Belt.

Subsequently Master Silva learned Karate under Grand Master Tony Jakson of Australia, who was the South Asian Representative of Sishiekan Karate Organization Japan, headed by Grand Master Shigeki Izumi.

ඔබ මෙසේ දිනූ දෑ ඊලඟ පරම්පරාවටත් දායාදකොට දීමට ඔබගත් උත්සාහයත් ඔබ ගැන ලියවෙන හැම වැකියකම ඉහළින් ලියවෙනු ඇති.


# මහා ශිව රාත්‍රී

# MAHA SHIVA RATHREE



හින්දු භක්තිකයින් අති විශේෂ ආගමික උත්සවයක් වූ **මහා ශිව රාත්‍රිය මාර්තු මස 4** වෙනි දිනට යෙදී තිබුනි.

ශිව රාත්‍රි දිනයේ සම්පූර්ණයෙන් උපවාසයේ යෙදුනහොත් ශිව දෙවියන් බැතිමතුන් ජීවත්වන ප්‍රදේශයටම ආරක්ෂාව සපයන බව ඔවුන්ගේ විශ්වාසයයි. තවද, සතුට, දියුණුව ලබාදෙන බව ශිව මහා පුරාණයේ පෙන්වා දෙයි. මෙම රැයෙහි උපවාස කිරීමෙන් මරණයෙන් පසුව අනිවාර්යයෙන්ම දිව්‍යලෝකයට යා හැකි බව හින්දූන්ගේ විශ්වාසයයි.



**මහා ශිව රාත්‍රිය සමරමින් ආගමික වතාවත්, පුද පූජා සිදු කළ හින්දු භක්තික අපේ සහෝදර සහෝදරියන්ට ඔවුන් පැතූ දේවාශිර්වාද මහිමයෙන් ඔවුන්ගේ සියළු පැතුම් ඉටුවේවායි ප්‍රාර්ථනා කරමු.**

# "ගලේ කොටුව බැන්දයි බැලුවයි තිරිකුණාමලේ...."

**තවත් සොඳුරු තුන් දිනයක්...**

**2019 අපේ මහ බැංකු විශ්‍රාමික සංගමයේ තුන් දින චාරිකාව**

නොගිය අයට දැන ගන්නත් එක්ක ගමනේ විස්තර කියන්න එපායැ. බස් දෙකේම ඉඩ තිබුණේ 80කට විතරලු. ඒත් චාරිකාවට තිබුණ ඉල්ලුම අනුව 90 ගමනට එකතුවෙලා හිටියා. හෝටලේ තිබුණු ඉඩකඩ අනුව අපේ ඇතැම් සහෝදර සහෝදරියන් පමාවී කළ ඉල්ලීම ඉටුකරන්න බැරිවීම ගැන සංවිධායක කමිටුව කණගාටු වුනා.

කවුරුත් දන්නවනේ අපි ගියේ ගලේ කොටු බැන්ද තිරිකුණාමලේට. මාර්තු පළවෙනිදා පාන්දර 5.30 ට පමණ බස් දෙක පිටත් වුණා. එකක් මොරටුවෙන්. අනික නුගේගොඩින්. බස් දෙක ඇල්දෙනියේ දී එකට එකතු වුණා.



උපි උදෑසන හීල් දානය ගත්තේ අඹේපුස්සේ දී. බස් රථ දෙකම කුරුණෑගල, දඹුල්ල හරහා දවල් 1.00 විතර හබරණට ආවා. දිවා භෝජනය සූදානම් කරල තිබුනේ ''අස්තාරා විලේජ්'' හෝටලේ. ගමේ ආරෙට පොළොස් ඇඹුල... කරවිල, සම්බෝල, වැව් මාළු... කියලා වැඩක් නැහැ.. නියම කෑම වේලක්.. මතක් වෙනකොට තාමත් කටට කෙළ උනනවා.

තිරිකුණාමලේට ඇවිදින් අපි ඉස්සෙල්ම ගියේ **'කින්නියා' උණුදිය උල්පත්** බලන්න. දිය උල්පත් බැලුව විතරයි... හැබැයි කවුරුවත් නෑවෙ නැහැ. (ගිය කට්ටිය හුගක් අය නාන්න හොරයි කියලා දැනුනා) නැගෙනහිර අපේ බොදු උරුමයේ මුදුන්මල්කඩක් හැටියට සලකන **වීල්ගම් රජමහා විහාරය** බලන්නයි අපි ඊලඟට ගියේ. හුඟක් විටනා පෞරාණික නටබුන් තියෙන මෙම විහාර භූමියත් ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්වෙලා.



දවසේ විශේෂ කටයුතු වෙන මුකුත් තිබුණේ නැහැ. රාත්‍රිය ලඟාවෙද්දී අපි හෝටලයට ගාල්වුණා. හෝටලේ නම් පංකාදුයි. ඔක්කොම පහසුකම් ඉහලින් ම තිබුණා. හෝටලේ නම **"අනන්තමා"** චාරිකාවට කලින් අපේ කමිටුවේ කිහිප දෙනෙක් තිරිකුණාමලයේ ඇවිල්ලා තමයි මේ වගේ හොඳ හෝටලයක් අපිට හොයාගෙන තියෙන්නේ.

මහන්සි නිවාගත්තු අපි කවුරුත් රෑ කෑමෙන් පස්සේ හොඳ හැටියට නිදාගත්හ. පස්සෙන්දා උදේ ඇහැ ඇරුනෙ අපේ ඥාන සහෝදරී දොරෙන් දොරට තට්ටු කර කර යනකොට. (හොඳ සංවිධායකයෝ එහෙම තමයි... නේද?)



උදෑසන ආහාරයෙන් පස්සේ අපි ත්‍රිමලේ නාවික කඳවුරට ගියේ **චීන වරාය වටේ බෝට්ටු සවාරියකට**. මේ විශේෂ ගමනට අවසර ගැනීමේදී ඇතිවෙච්චි බාධාවල දී හිටපු නාවික හමුදාපති ජයනාත් කොළඹගේ මහත්මයත්

(22 පිටුවට)

ඉන්දීවරී මහත්මියත් හුඟාක් උදව් කරලා තියෙනවා. ඒ අයට ඉතින් අපිත් ස්තූති කරන්න ඕන.



අපේ සමහර කාන්තාවෝ බෝට්ටුවට නගින්න ගියේ බයෙන් බයෙන් වගේ. කවදා මුහුදෙ බෝට්ටු පැදලද නේද...? ඒ වුණාට සමහර අය චාරිකාව ඉවර වෙලා බෝට්ටුවෙන් බහින්නත් අකමැත්තෙන් වගේ හිටියේ... ඒ තරං බෝට්ටු ගමනට ආසවෙලා.

දිවා ආහාරය ගත්තේ **ජාතික සර්වෝදය අවන්හලෙන්**. එතනින් ලැබුනෙත් ප්‍රණීත ආහාර වේලක්. සවස්වරුවේ අපි සේන්දු වුණේ අපේ ඉතිහාසයට සම්බන්ධ උතුම් තැනකට. තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයින් ලංකාවට ගෙන ආ ජීවමාන බුදුන්ගේ කේශධාතු නිදන් කරලා තැණුනු ලෝකයේ ප්‍රථම චෛත්‍යය **ගිරිහඬු සෑය** වඳින්න. අපි හොඳට පෙරළි පෙරළි වැන්දා.

සොබාදහමේ මනස්කාන්ත දසුන් මවන **නිලාවේලි මුහුදු තීරයටයි** අපි ඊලගට ආවේ.
....කැරට් පෙත්තක පාට අරගෙන මුහුදෙ ගිලෙන ඉර.... රන්වන් අහස... ඒ පාට තවරගෙන වෙරලට දුවගෙන එන රළ පොඩි ටික.... අපේ පොඩි කාලෙ සිහිකරමින් අපි ඔක්කොම ''රැළ පෑගුව'' හැබැයි සමහර කාන්තාවො රැල පෑගුවේ නැහැ, නියපොතුවල ගාල තියෙන ලිප්ස්ටික්.... නැහැ... නැහැ... මට වැරදුනා... කියුටෙක්ස්.... මුහුදු වතුරට සවුත්තු වෙයි කියලා. කොහොම වුණත් අපි හැමෝටම **නිලාවෙලි වෙරල ගත සැනසූ සිත පිනවූ සොඳුරු තැනක් වුණා.**

දවස අපි හමාර කළේ විනෝදයට වඩා භක්තියට මුල් තැන දීලා. බෞද්ධ, හින්දු, කතෝලික කොයි කාගෙත් වන්දනාමානයට ලක්වුණ කෝනේශ්වරම් කෝවිල අපි ඊළඟට වැඳ පුදා ගත්තා.

ඔන්න.... අපි කාට කාටත් එකතුවෙලා විනෝදවෙන්න පුළුවන් හෝරාවක් එදා රාත්‍රියේ දී උදාවුණා....

හෝටලයේ සංගීතය වා තලයට කෙමෙන් කෙමෙන් එකතු වුණා... සිංදු කියන්න බැරි වුණාට හොඳ ගායකයොත් අපිට ඉන්නවනේ. ඉතින් ඒ කවුරු කවුරුත් ගීත ගායනයට එකතු වුණා... සංගීතය ගලාගෙන එනවා.... සිංදු ගැයෙනවා.... ඉතින් නටන්නේ නැතුව ඉන්න පුළුවනැ. වයස්කම කොහේ ගියාද දන්නේ නැහැ.... භද්‍ර යෞවනයේ දාපු අඟර දඟර ටික ටිකෙන් ටික ආවේ තැනැයි එළියට... (හැබැයි ටිකක් සැර බාලවෙලා) .... මැදයම් රැයත් ලංවෙලා... සාජ්ජේ ඉවර වෙනකොට.



මේ සාජ්ජේ දී විතරක් නෙමෙයි බසය පුරාමත් ගායනයෙන් නම් අඩුවක් තිබුණේ නැහැ. සඳුන්, ආරියදාස වගේ හොඳ ගායකයින්ට ඥාණා, ප්‍රනීතා, පද්මිණි, සුනේත්‍රා, ස්වර්ණා ජයලාල්, අල්විස්, ධර්මසේන, ශ්‍රීමතී, කරුණා සහ අනිත් අයත් ලොකු සහායක් දුන්නා.

තුන්වැනි දවස අපේ වටිනා ඉතිහාසයට සමවදින්න වෙන් කරලා තිබුණ වගේ දැනුනා. අපිට හොඳට සලකපු හෝටලයට ආයුබෝවන් කියලා අපි ගියේ **බුදුන්ගේ ලලාට ධාතුව නිදන් කරලා ගොඩනගාපු සේරුවාවිල චෛත්‍යය** වඳින්න. එතැනින් අපි පොළොන්නරුවට ලඟාවෙලා ''දීප උයනේ'' දී දිවා ආහාරය ගත්තා.

බුදුන්ගේ දකුණු දළඳව තැන්පත්කරලා තියෙන **සෝමාවතී චෛත්‍යය** වැඳගන්නයි ඊලගට අපි ගියේ. මේ චෛත්‍යය මුදුනින් බුදුරැස් පවා විහිදෙනවලු. මෙම සිද්ධස්ථානය අති පූජනීය ස්ථානයක් කියල අපේ හිතට ඉබේම දැනුනා.

අපි ආපසු කොළඹට ලඟාවුණේ මධ්‍යම රාත්‍රියත් පහුවෙලා. ''ගමන නං හරි ෂෝක්...'' හැමෝම ඒ හැඟුමෙන් මුණ පුරෝගෙන බස් එකෙන් බහින කොට එකිනෙකා දිහා බැලුවෙ හිතේ දුකෙන් වගේ... ඇයි චාරිකාව ඉවරයිනේ.

ලබන චාරිකාවේදීත් අපි මේ ව ගේ මුණගැසෙමු. හැමෝගෙම ප්‍රාර්ථනාව වුනේ ඒකයි. මේ රසවත් ගමන සංවිධානය කර කමිටුවට ස්තූති කරමින් අපි එකිනෙකා විසිර ගියා

# ‘නස්රුදීන්ගේ කතා’... පොතෙන්

**නස්රුදීන්ගේ කතා ලොව මෙතෙක් පහළ වී ඇති භාවග්‍රාහී කතා වර්ග අතරින් එකක් වේ. පෙර අපර දෙදිග බුද්ධිමතුන් විසින් උසස් යැයි සම්භාවිත මේ කතා කලාව වෙනත් කතා වර්ග වලින් වෙන්කර හඳුනාගැනීමට තරම් ප්‍රබල ලක්ෂණයන්ගෙන් යුක්තය.**

**ගැහැණියයි මීවිතයි** - මේ දෙක ගැන නස්රුදීන්ගේ දර්ශනය කොහොම වෙයිද? හොඳයි අපි කියවලා බලමුකෝ නස්රුදීන්ගේ දර්ශනවාදය කියන මේ කතාව.

## දර්ශන වාදය

ලෝකප්‍රකට දර්ශනවාදියකු වූ නස්රුදීන් **මීවිතයි ගැහැණියයි** ළඟින්ම ආශ්‍රය කළා. ඔහු උසස් පවුල්වල කෙල්ලනුත් එක්ක ක්ෂේම භූමිවල මධු සාදවලට සහභාගි වුනා.

නස්රුදීන් දිනක් මුහුදු වෙරළේ රූමත් නළඟනකගේ තුරුලේ දක්නට ලැබුන කියලා ප්‍රවෘත්ති මාධ්‍යවලින් ප්‍රකාශ වුනා. මේ පුවත දැකපු නස්රුදීන්ගේ පියා අතිශයින් කෝපයට පත්වුනා. ඔහු නස්රුදීන්ට පණිවුඩයක් යැව්වා වහාම තමා හමුවන්න කියලා. නස්රුදීන්ව දැක්ක විතරයි ඔහුගේ පියා ඔහුට දොස් තබන්නට පටන් ගත්තා, ඔහුගේ නොමනා හැසිරීම ගැන. දර්ශනවාදියෙක් වුනු ඔහු එසේ හැසිරීම වරදක් බවත් එවැනි චරිතයක් ඇත්තෙකුට දර්ශනවාදී අදහස් ඉදිරියට පහළ නොවන්නට ඉඩ ඇති බවත් නස්රුදීන්ගේ පියා කිව්වා.

බිම බලාගෙන හිටිය නස්රුදීන් ඔලුව නොඋස්සාම මෙහෙම කීවා.

> **"මම සියළු දර්ශන පහළ කරගත්තේ මීවිතත් ගැහැණියත් තුළින්. මේ දෙක නොතිබුනානම් නස්රුදීන්ට මොන දර්ශනවාදද?"**

**ගැහැණියයි මීවිතයි** ගැන නස්රුදීන්ගේ දර්ශනයට ඔබත් එකඟද?

හොඳයි එහෙනම්, ලබන සැඳෑවට ලියල එවන්නකො.

# වාර්ෂික මහා සභා රැස්වීම

අප මහ බැංකු විශ්‍රාමික සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම **2019 අප්‍රේල් මස 6 වන දින පෙ.ව. 9.00 ට රාජගිරිය බැංකු ශ්‍රවණාගාරයේදී** පැවැත්වේ. සංගමයේ ඉදිරි කටයුතු සාර්ථක කරගැනීම සඳහා ඔබගේ දායකත්වය අත්‍යාවශ්‍යව පවතී. මෙම රැස්වීමට සහභාගී වීමෙන් එම සහභාගීත්වය ඔබට ලබාදිය හැකියි. තවද අප විසින් දැනට නිකුත් කොට ඇති **මහ බැංකු විශ්‍රාමිකයන්ගේ අත්පොත** සංගමයේ සාමාජිකයන් හට එදින ලබාගත හැක. මෙතෙක් සංගමයේ සාමාජිකත්වය ලබා නොගත් අපගේ සහෝදර සහෝදරියන්ට එදිනට සමාජිකත්වය ලබාගත හැක.

**මෙය ඔබ සැමට කෙරෙන ගෞරවණීය ආරාධනයකි.**

**"තම අතීතයට ගරු කරන ආදරය කරන අයෙක් වේද ඔහු සැබවින්ම සංතෘෂ්ඨිමත් මිනිසෙකි."**

**ජෝන් ලියෝ**


චිත්‍රරටා නිමැවුම සහ සංස්කරණය
**හේමසිරි ෆර්ඩිනෑන්ඩු**

**மஹ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය**
**2018 ජූලි - සැප්තැම්බර් කලාපය**

**சந்தாவ**

අංක : QD/09/පුවත්/2019 යටතේ ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලදි.



**ගරු ලේකම්,**
**මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය,**
**104/8, කුරේ පෙදෙස, ස්ටැන්ලි තිලකරත්න මාවත,**
**නුගේගොඩ.**

සැඳෑවට ලිපි :
**හේමසිරි ෆර්ඩිනෑන්ඩු,**
**28/35/7, බුද්ධාලෝක මාවත,**
**සුවාරපොළ, පිළියන්දල.**



Typesetting - **Hiru Advertising** - Moratuwa.
hiruadvt@gmail.com